**මාර්ග ජාල වැඩි දියුණුකිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 - 2017**

---

මාර්ග ජාල වැඩි දියුණුකිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 කොටසේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර) සහ චීන සහයෝගීතා සංවර්ධන බැංකුව (චී.ස.බැ) අතර 2011 මාර්තු 31 දින එළඹි අංක 4500062212011110472 දරන ණය පහසුකම් ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

---

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වූ වර්තමානයේ මහා මාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කිලෝමීටර් 619.72 ක ප්‍රමුඛතා මාර්ග වැඩිදියුණුකිරීම හා පුනරුත්ථාපනය කිරීමයි. ණය පහසුකම් ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 61,438 කට සමාන එ.ජ.ඩො. මිලියන 556 ක් වූ අතර ඉන් රු. මිලියන 55,250 කට සමාන එ.ජ.ඩො. මිලියන 500 ක් සැපයීමට චීන සහයෝගීතා සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 ජූනි 28 දින ආරම්භ කරන ලද අතර 2014 ජූනි 28 දින නිම කිරීමට නියමිතව පැවතුණි. කෙසේවෙතත්, ණය වලංගු කාලසීමාව ගෙවීම් අවසන් වන තෙක් දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන

ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ අපසු ගැනීම්, ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේ ද යන බව,

(එ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබූණු බව,

(ඇ) ණය පහසුකම් ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රධාන වියදම් ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පත් කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව,

(ඉ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත පරිදි දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යායනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො . මිලියන | රු.මිලියන | එ.ජ.ඩො . මිලියන | රු.මිලියන |
| චීන සහයෝගීතා සංවර්ධන බැංකුව | 500.00 | 55,250.00 | 370.00 | 2.43 | 369.01 | 499.99 | 64,511.01 |
| ශ්‍රී ලංකා රජය | 56.00 | 6,188.00 | 200.00 | - | 47.00 | - | 7,090.02 |
| මාර්ග සංවර්ධන අධිකාරිය - | | | | | | | |
| ජා.ඉ.බැං ණය | - | - | - | - | - | - | 1,100.29 |
| සම්පත් බැංකු ණය | - | - | - | - | 1,804.61 | - | 1,804.61 |
| එකතුව | **556.00** | **61,438.00** | **570.00** | **2.43** | **2,220.62** | **499.99** | **74,505.93** |

### 3.2 භෞතික ප්‍රගතිය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ලේඛනයට අනුව, නුවරඑළිය සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජාතික මාර්ග කිලෝමීටර් 504.90 ක් සහ පළාත් මාර්ග කිලෝමීටර් 85 ක් පුනරුත්ථාපනය කිරීම, ගුවන් පාලම් 02 ක් ඉදිකිරීම හා පාලම් 46 ක් පුළුල් කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම ප්‍රමුඛතා පදනමක් මත 2014 ඔක්තෝම්බර් 20 වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ජාතික මාර්ග කිලෝමීටර් 514.10 ක් සහ පළාත් මාර්ග කිලෝමීටර් 105.62 ක පුනරුත්ථාපන කටයුතු, ගුවන් පාලම් 02 ක ඉදිකිරීම් කටයුතු සහ පාලම් 71 ක ප්‍රතිසංස්කරණ කටයුතු 2015 මැයි 15 වන විට අවසන් කර තිබූ නමුත් ඒ සඳහා නියමිත දින සිට මාස 07 ක් ප්‍රමාදවී ඇත. තවද, කොන්ත්‍රාත්කරු විසින් ගොනුකරන ලද බේරුම්කරණ නඩුවක් හේතුවෙන් අවසාන ගෙවීම් 2017 දෙසැම්බර් 31 දක්වා සමථයකට පත්කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සේවක පාරිශ්‍රමික සහ වෙනත් පරිපාලන කටයුතු සඳහා 2016 සහ 2017 වර්ෂ වලදී පිළිවෙලින් රු.මිලියන 21.91 සහ රු.මිලියන 12.26 ක් ව්‍යාපෘතිය විසින් අමතර පිරිවැයක් දරා තිබුණි.

(ආ) 2014 සැප්තැම්බර් 15 සහ 2015 ජූනි 22 දින පිළිවෙලින් මාර්ග සංවර්ධන අධිකාරියට භාරදුන් බදුල්ල - කරමැටිය - ආඳාඋල්පත මාර්ගය සහ තැන්නේකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ගයේ පුනරුත්ථාපනය කරන ලද කොටස්වලට 2014 දෙසැම්බර් මාසයේ ඇතිවූ ගංවතුර තත්ත්වය හේතුවෙන් අලාභහානි සිදුවී තිබුණි. ප්‍රතිසංස්කරණය වෙනුවෙන් නව කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සඳහා වන ඇස්තමේන්තුගත වියදම වූ රු. මිලියන 131.91 ක මුදල ණය මුදලින් දරා තිබුණි. කොන්ත්‍රාත්තු යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු 2017 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණය මත පදනම්ව විචල්‍යතා නියෝග සහ බේරුම්කරණය වෙනුවෙන් පැන නඟින පිරිවැය පියවාගැනීම සඳහා දේශීය බලපත්‍රලාභී විශේෂිත බැංකු දෙකකින් අමතර ණය ලබාගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය පියවරගෙන තිබුණි. කෙසේවෙතත්, ණය පියවීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කර ඇති විධිවිධාන විගණනය සඳහා පැහැදිලි නොකෙරුණි.

(ආ) මුල් කොන්ත්‍රාත් වටිනාකමට ඇතුළත් කර ඇති රක්ෂණ ආවරණ සඳහා වන පිරිවැය පියවා ගැනීම සඳහා මීගමුව - ගිරිඋල්ල මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කාර්යේ නියුතු කොන්ත්‍රාත්කරුට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1.7 ක අතිරේක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) ව්‍යාපෘතිය විසින් මිළදී ගන්නා ලද රු.මිලියන 54.60 ක් වටිනා ජංගම නොවන වත්කම් 2017 දෙසැම්බර් 31 දින වන විටත් මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී නොතිබුණි. තවද, ව්‍යාපෘතිය විසින් මිළදී ගන්නා ලද වත්කම් ලේඛනගත කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් ද පවත්වාගෙන ගොස් නොතිබුණි.